## දෙවැනි කොටස

# මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු

### ගිණුම්

1978 වර්ෂය සඳහා මහ බැංකුවේ මුදල් ගිණුම් ඉදිරි පිටුවෙහි 2.3 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1977 වසර හා සසඳන විට, 1978 දෙසැම්බර් අග වන විට දක්නට ලැබුන වෙනස්කම් පහත දැක්වේ.

**2. 1 සංඛ්‍යා සටහන – ගිණුම්වල සාමාන්‍ය වෙනස්වීම්**

| | | වෙනස (රුපියල් දශලක්ෂ) |
|---|---|---|
| මුළු ඉල්ලුම් වගකීම් | .. | + 1365.3 |
| ව්‍යවහාර මුදල් සංසරණය | .. | + 289.4 |
| ඉල්ලුම් තැන්පතු | .. | + 1473.1 |
| විදේශීය ණය ගැනීම් | .. | – 397.2 |
| ජාත්‍යන්තර සංචිතය | .. | + 1806.0 |
| දේශීය වත්කම් | .. | + 229.1 |

\+ වැඩිවීම – අඩුවීම

1978 වර්ෂය සඳහා මහ බැංකුවේ ආදායම රුපියල් 61,93,29,410 ක් වූ අතර, සංචිත සඳහා වෙනස් කිරීම් ද ඉඩම් හා ගොඩනැගිලි සහ කාර්යාලයීය ලී බඩු ආදියෙහි වටිනාකම මත වූ ක්ෂයවීම් වෙනුවෙන් කෙරුන ප්‍රතිපාදන ද ඇතුළු වියදම රුපියල් 61,83,29,410 ක් විය. මේ අනුව ලත් රුපියල් 10,00,000 ක ශුද්ධ ලාභය මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය අනුව අතිරික්තයට ගෙන යන ලදී.

### විදේශීය විනිමය

1978 වර්ෂය තුළදී ද ශ්‍රී ලංකා රුපියල පාවෙමින් පැවතුණ අතර, එ ජ. ඩොලරය, රන් පවුම, බටහිර ජර්මන් ඩොයිෂ් මාර්කය, ප්‍රංශ ප්‍රැන්කය, ජපන් යෙන් හා ඉන්දියානු රුපියල සඳහා වූ මධ්‍ය අනුපාතිකය එක් එක් වැඩ කරන දිනය තුළ අ. භා. 2.00 ට මහ බැංකුව විසින් නියම කරණ ලදී. වර්ෂය අවසානයේ දී මෙකී මුදල් වර්ෂය සඳහා නියමිතව තිබුණු අනුපාතිකයන් මෙසේය.

**2.2 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික**

| මුදල් වර්ගයේ ඒකක සියයට | මධ්‍ය අනුපාතිකය | විදුලි පණිවුඩ පැවරුම් සඳහා සිය ගනුදෙනු කරුවන් වෙනුවෙන් වෙළඳ බැංකුවල නිල විනිමය අනුපාතිකය | |
|---|---|---|---|
| | | ගැණුම් | විකුණුම් |
| එ. ජ. ඩොලරය | රු. 1550.50 | රු. 1549.00 | රු. 1552.00 |
| රන් පවුම | රු. 3167.05 | රු. 3164.05 | රු. 3170.05 |
| ඩොයිෂ් මාර්ක් | රු. 855.35 | රු. 854.55 | රු. 856.15 |
| ප්‍රංශ ප්‍රැන්ක් | රු. 374.60 | රු. 374.25 | රු. 374.95 |
| ජපාන යෙන් | රු. 8.0365 | රු. 8.0290 | රු. 8.0440 |
| ඉන්දියානු රුපියල් | රු. 190.65 | රු. 190.45 | රු. 190.85 |

මහ බැංකුවේ විදේශීය විනිමය ගණුදෙනු පරිශිෂ්ඨයේ 7 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

# මුදල් හා බැංකු ගනුදෙනු

**1978 දෙසැම්බර් මස 31 වැනි දිනට**

**1978 දෙසැම්බර් මස 31 වැනි**

## වගකීම

| 1977 දෙසැම්බර් මස 31 දින රුපියල් | | | 1978 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය .. .. | 1,50,00,000 | |
| 6,20,00,000 | 7,70,00,000 | අතිරික්තය .. .. | 6,30,00,000 | 7,80,00,000 |
| | | **වගකීම** | | |
| 303,84,54,433 | | සංසරණයෙහි පවත්නා නෝට්ටු .. | 335,64,71,756 | |
| 13,06,83,995 | 321,91,38,428 | සංසරණයෙහි පවත්නා කාසි .. | 15,21,18,668 | 350,85,90,424 |
| | | **තැන්පතු** | | |
| 8,99,08,192 | | රජය .. .. | 103,35,59,401 | |
| 1,47,84,360 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන .. | 1,57,99,218 | |
| 60,65,23,969 | | වෙළඳ බැංකු .. .. | 73,77,53,831 | |
| 125,73,44,758 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන .. .. | 156,92,77,554 | |
| 1,55,125 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු.11,72,21800/- හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල | 2,84,447 | |
| 18,78,55,098 | 215,65,71,502 | අනෙකුත් .. .. | 27,29,79,662 | 362,96,54,113 |
| | 55,23,29,297 | විදේශීය ණය ගැනීම .. .. | | 15,51,16,452 |
| | 7,51,28,288 | මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදල | | 12,50,00,000 |
| | 544,89,26,975 | අනෙකුත් වගකීම හා ගිණුම .. | | 674,35,77,250 |
| | 1,152,90,94,490 | | | 1,423,99,38,239 |

**1978 දෙසැම්බර් මස 31 වැනිදසින්**

| 1977 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් | | 1978 දෙසැම්බර් මස 31 වැනි දින රුපියල් |
|---|---|---|
| 27,99,27,189 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා බැංකු ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් ඇතුළුව) සහ මුදල් නීති පණතේ 38 වැනි වගන්තිය ප්‍රකාර ඉන් පසුව කරන ලද වෙන් කිරීම .. .. | 61,83,29,410 |
| 10,00,000 | ශේෂය 1978 දෙසැම්බර් මස 31වැනිදසින් අවසන් වූ වර්ෂයේ ශුද්ධ ලාභ යයි. මෙම ලාභය මුදල් නීති පණතේ 39(ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයක් වශයෙන් එතැන් සිට යොද ගන්නා ලදී. | 10,00,000 |
| 28,09,27,189 | | 61,93,29,410 |

ඩබ්ලිව්. රාසපුත්‍රම්
අධිපති.

වී. එස්. සුබ්‍රමානියම්
ප්‍රධාන ගණකාධිකාරී.

**2·3 සංඛ්‍යා සටහන**

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්

## දිනට ශේෂ පත්‍රය

### වත්කම්

| 1977 දෙසැම්බර් 31 දින රුපියල් | | | 1978 දෙසැම්බර් මස 31 දින රුපියල් | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 388,35,92,323 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් .. .. | 527,45,83,604 | |
| 27,50,71,378 | | *විදේශීය රාජ්‍ය හා රාජ්‍ය නොවන සුරැකුම් පත් . .. | 34,54,72,040 | |
| 16,78,63,911 | 432,65,27,612 | විශේෂ ආපසු ගැනීම් හිමිකම්පත් | 51,23,81,125 | 613,24,36,769 |
| | | **දේශීය වත්කම්** | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 61,74,09,125 | | රජයට .. .. | 95,55,00,000 | |
| | | අනෙකුත් අයට – මධ්‍යම හා | | |
| 5,47,42,609 | | දීර්ඝ කාලීන .. | 6,38,16,667 | |
| 82,98,37,000 | | කෙටි කාලීන .. | 101,21,22,000 | |
| 242,00,60,839 | 392,20,49,573 | රජයේ සහ රජය සහතික කළ සුරැකුම් පත් .. | 211,97,04,609 | 415,11,43,276 |
| | 328,05,17,305 | අනෙකුත් වත්කම් හා ගිණුම් .. | | 395,63,58,194 |
| | | * 1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 55 30,271/- ක ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450/- වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දින වල මෙකී සුරැකුම් පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම් පිළිවෙලින් රුපියල් 29.38,759/- ක් සහ රුපියල් 34,340/- ක් විය.) | | |
| | 1,152,90,94,490 | | | 1,423,99,38,239 |

## අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

| 1977 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | | | 1978 දෙසැම්බර් 31 වැනි දින රුපියල් | |
|---|---|---|---|---|
| | 28,09,27,189 | පොළී ආදිය .. .. | | 61,93,29,410 |
| | 28,09,27,189 | | | 61 93,29.410 |

1978 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය සමග කියවන ලද 1971 අංක 38 දරණ මුදල් නීති පණතේ 13 (1) වගන්තිය සහ මුදල් නීති පනතේ (පරි. 422) 42 (1) වගන්තිය අනුව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් නීති පණතේ (පරි. 422) 42 (2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමැතිතුමා වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථාකාලයේ දී ඉදිරිපත් කෙරේ.

1979 මාර්තු මස 30 වැනි දින,
කොළඹ – 7,
විගණන කාර්යාලයේදීය.

ඩී. එම්. ඩබ්ලිව්. විජයසූරිය
විගණකාධිපති.

**විදේශීය මුදල් නෝට්ටු**

නියමිත විනිමය අනුපාතිකයනට අනුව ශ්‍රී ලංකාවේ කටයුතු කරන වෙළෙඳ බැංකු වලත් නම් කරන ලද විදේශීය මුදල් නෝට්ටු වර්ග මිලදී ගැනීම සහ එකී බැංකුවලට එම නෝට්ටු විකිණීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී.

**ආසියානු නිෂ්කාශණ සංගමය**

මහ බැංකුව ආසියානු නිෂ්කාශණ සංගමයට සහභාගිවන බැංකුවක් වශයෙන් තවදුරටත් කටයුතු කළේය. 1978 වර්ෂය තුළදී ආසියානු නිෂ්කාශණ සංගමය මගින් කෙරුන ගණුදෙණු බේරීම් වශයෙන් සහභාගි වන අනිත් බැංකුවලට ශ්‍රී ලංකාව වෙනුවෙන් ගෙවන ලද ශුද්ධ ප්‍රමාණය රුපියල් 1,08,13 83,001.10 ක් විය.

**1977 අංක 17 දරණ විදේශ විනිමය හිමිකම් සහතික අවලංගු කිරීමේ නීතිය**

ඉහත සඳහන් පනතේ 3 (1) වගන්තිය අනුව, අවලංගු කිරීමේ නීතියේ 2 වැනි වගන්තිය මගින් ප්‍රතිපාදනය කර නොමැති විවිධිස ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදළ නිරවුල් නොකළ සියළුම කරුණු මහ බැංකුව විසින් බැහැර කර ඇත.

**සියරට යන ඉන්දියානුවනට දෙන ආධාර මුදල**

1977 නොවැම්බර් 16 වැනිද සිට ක්‍රියාත්මක වන පරිදි ඒකීය විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වාදීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1964 ඉන්දු-ලංකා ගිවිසුම අදල වන සියරට බලා යන ඉන්දියානුවන්ට ප්‍රේෂණය කිරීමට බලය දෙන ලද මුදල් ප්‍රමාණය හෝ ඉන් කොටසක් වෙනුවෙන් සියයට 65 කට සමාන ආධාර මුදලක් දීමට රජය තීරණය කර ඇත.

සියරට බලා යන ඉන්දීය වතු කම්කරුවනට ශ්‍රී ලංකාව හැර යාම සඳහා දිරි ගැන්වීමක් වශයෙන් ශ්‍රී ලංකා රුපියල් 500/- ක් හා ඉන් සියයට 65 ක මුදලක් ප්‍රසාද දීමනාවක් වශයෙන් දීමට ද රජය තීරණය කර ඇත.

රජය වෙනුවෙන් යටකී ක්‍රම දෙක මෙහෙයවනු ලබන්නේ මහ බැංකුව මගිනි. ප්‍රේෂණයන් කරණු ලබන අවස්ථාවේ දී සියරට බලා යන්නන් වෙත එකී මුදල් වෙළඳ බැංකු විසින් ගෙවනු ලබන අතර පසුව මහ බැංකුව විසින් එම ප්‍රමාණයන් වෙළෙඳ බැංකු වලට ප්‍රතිපූරණය කරනු ලැබේ.

**දේශීය බැංකු කටයුතු**

රජයේ සුරකුම්පත් හා වාණිජ හා නිෂ්පාදන ණයට අදල භාවිතිය පොරොන්දු නෝට්ටු මත දෙනු ලබන අත්තිකාරම් සඳහා මහ බැංකුවේ පොළී අනුපාතිකය වසරකට සියයට 10 මට්ටමෙහිම තවදුරටත් පැවතිනි. සහතික මිල ක්‍රමය යටතේ වී මිලට ගැනීම හා මෙරට නිෂ්පාදිත කෘෂිකාර්මික ද්‍රව්‍ය මිලදී ගැනීම, විකිණීම හෝ ගබඩා කිරීම සඳහා සමුපකාර සමිතිවලට, කෘෂිසේවා මධ්‍යස්ථානවලට හා බලය ලත් පුද්ගලයන්ට දෙනු ලබන අත්තිකාරම් වෙනුවෙන් භාවිතිය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන මහ බැංකුව විසින් වෙළෙඳ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම් සඳහා පොලිය නොවෙනස්ව සියයට 3 මට්ටමෙහිම පැවතිනි. වී, එළවළු සහ අනෙකුත් විශේෂිත භෝග නිෂ්පාදනය සඳහා සමුපකාර සමිති හා ගොවීන් විසින් දෙනු ලබන භාවිතිය පොරොන්දු නෝට්ටු ඇපයට තබාගෙන මහ බැංකුව විසින් වෙළෙඳ බැංකුවලට දෙනු ලබන ණය සඳහා පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 1½ මට්ටමෙහිම පැවතිනි. එසේ වුවද, මෙම පහසුව භුක්ති විඳින වෙළඳ බැංකු සමුපකාර සමිතිවලින් වර්ෂයකට සියයට 8 ට නොවැඩි (නියමිත දින ගෙවීම් කළහොත් වර්ෂයකට සියයට 3 ක ප්‍රතිදානයකට යටත්ව) පොළියක් ද කෙළින්ම ගොවීනට ණය දෙන අවස්ථාවන්හිදී ඔවුන්ගෙන් සියයට 9 ට නොවැඩි පොළියක් අයකළ යුතු විය.

භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ වට්ටම් අනුපාතිකය ටෙන්ඩර් මගින් හෝ මහ බැංකුවෙන් එකී භාණ්ඩාගාර බිල්පත් මිලට ගත් අනුපාතිකයට වඩා සියයට 1/8 ඉහළ මට්ටමක තවදුරටත් පැවතුනි.

**ණය සඳහා ඇපවීමේ ක්‍රමය**

1978 දී වී, එලවළු සහ අනෙකුත් නිශ්චිත භෝග වගා කිරීම සඳහාත් තේ නැවත වගා කිරීම හා තේ කම්හල් නවීකරණය සඳහාත් වෙළෙඳ බැංකු විසින් දෙන ලද රුපියල් 22,34,34,443.44 ක ණය සඳහා රජය වෙනුවෙන් මහ බැංකුව ඇප විය. 1978 ඔක්තෝබර් මාසයේ සිට මෙකී ඇපවීමේ ක්‍රමය ඉවත් කිරීමට රජය තීරණය කළේය.

**මැදි හා දිගුකාලීන ණය**

මැදි හා දිගුකාලීන ණය ක්‍රමය යටතේ ණය දෙන ආයතනවලට මහ බැංකුව විසින් දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය මත අය කෙරෙන පොලී අනුපාතිකයන් මෙසේය.

(අ) කෘෂිකර්මාන්තය නංවාලීම හෝ සංවර්ධනය සඳහා දෙනු ලබන ණය සඳහා වර්ෂයකට සියයට 6½ ;

(ආ) කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා වර්ෂයකට සියයට 7½.

වර්ෂය තුළදී, ණය දෙන ආයතනවලට දෙන ලද මුළු ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් 2,10,71,008.96 ක් විය.

**බැංකු හර බද්ද**

බැංකු හර බද්ද එකතු කිරීමේ වගකීම තවදුරටත් මහ බැංකුව වෙත පැවරිනි.

**අනිවාර්ය ඉතිරි කිරීම**

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීම් පනත සහ 1972 අංක 15 දරණ ආදායම් උපරිම හා අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල්වල භාරකරු වශයෙන් තවදුරටත් ක්‍රියාකළ මහ බැංකුව, රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල පරිපාලනය කළේය. වර්ෂය තුළදී, දයකයන් වෙතින් ලැබුනු අයදුම්පත් 6,829 ක් වෙනුවෙන් බැංකුව දයකයන් වෙත රුපියල් 1,93,09,364.56 ක් (පොලී ඇතුළුව) ගෙවන ලදී.

**ව්‍යවහාර මුදල් නිකුතුව**

1978 වර්ෂය අගදී මුළු ව්‍යවහාර මුදල් සංසරණය රුපියල් දශලක්ෂ 3508.6 ක් විය මෙය ඉකුත් වර්ෂයේ අගදී සංසරණය වෙමින් පැවති රුපියල් දශලක්ෂ 3219 1 සංඛ්‍යාවට වඩා රුපියල් දශලක්ෂ 289.5 ක වැඩිවීමක් පෙන්වයි. ඉකුත් වර්ෂයේ දී රුපියල් 797.6 කින් වැඩි වූ නෝට්ටු සංසරණය, 1978 අගදී රුපියල් දශලක්ෂ 268.0 කින් වැඩි විය. මෙම වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 220 6 ක් සමන්විත වූයේ රුපියල් සියයේ නෝට්ටුවලිනි. 1978 දී කාසි සංසරණය වැඩිවූයේ රුපියල් දශලක්ෂ 21.5 කිනි සෑම වටිනාකම් වලින්ම යුතු කාසි මෙම වැඩිවීමට ඇතුලත් විය. ඉකුත් වර්ෂයේදි කාසි සංසරණය රුපියල් දශලක්ෂ 14.4 කින් වැඩිවී තිබිණි.

1978 දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය සහිත රුපියල් 100 හා 50 වටිනාකම්වලින් යුතු නව මෝස්තරයක ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කරන ලදී. මෙම නෝට්ටු 1970 ඔක්තෝබර් 25 වැනිදයින් පසු නිකුත් කරන ලද සම වටිනාකම්වලින් යුතු දැනට සංසරණයේ පවත්නා නෝට්ටුවල ප්‍රමාණයෙන්ම යුක්ත වෙයි. මෙකී පරණ නෝට්ටු ද නව මෝස්තර යේ නෝට්ටු සමග සංසරණයේ පැවතිනි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රථම ජනාධිපති තුමා පත් කිරීම සිහිකිරීම වස් ජනාධිපති උතුමාණන්වහන්සේගේ පිළිරුව රැගත් රුපියල් එකේ වටිනාකමින් යුතු අනුස්මරණ කාසියක් නිකුත් කරන ලදී. මෙසේ නිකුත් කරන ලද කාසි ද දැනට භාවිතය වෙමින් පවත්නා රුපියල් එකේ කාසිවල විශේෂතාවයන්ගෙන් හා ප්‍රමාණයන්ගෙන් යුතු වෙයි.

DISCARDED

1978 දී නිකල් පිත්තල මිශ්‍රණයකින් තැනූ සත පහේ හා දහයේ වටිනාකම්වලින් යුතු කාසිවල හිඟයක් උද්ගත වූ හෙයින් ඇලුමිනියම් ලෝහ මිශ්‍රණයකින් තැනූ එම වටිනාකම් වලින් යුතු අලුත් කාසි නිකුත් කරන ලදී. මෙම කාසි පසුව ඒකී නිකල් තඹ කාසි වෙනුවට භාවිතය කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. අලුත් කාසි නිකල් පිත්තල වලින් තැනූ සත පහේ හා දහයේ කාසිවලට සමානය.

## බැංකු පරිපාලන

මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ 1978 වර්ෂයේ දී වෙළඳ බැංකු 8 ක පරීක්ෂණ කටයුතු ආරම්භ කළ බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව වර්ෂය තුළදී ඉන් හයක පරීක්ෂණ කටයුතු අවසන් කළේය.

1975 අංක 32 දරණ පනතින් සංශෝධිත 1970 අංක 27 දරණ බැංකු හර බදු ආඥා පනත යටතේ, පරිපාලනය හා සම්බන්ධ කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් දිගටම කරගෙන යන ලද අතර, පනතේ 15 වැනි වගන්තිය යටතේ බලයලත් නිලධාරියාගේ සහතික සැපයිය යුතු තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ අරමුණ ඇතිව වෙළඳ බැංකු පරීක්ෂා කිරීම කරගෙන යන ලදී.

## සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව

සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවෙහි කාර්යයන් 1978 වර්ෂයෙහිදී සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදලෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා අනුමත ණය දෙන ආයතන මගින් ඉදිරිපත් කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති අගැයීමට අමතර වශයෙන් දෙපාර්තමේන්තුව විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහාය ද ඇතිව සුළු කර්මාන්ත සඳහා ණය සහතික ක්‍රමයක් ආරම්භ කරනු ලැබීය. මෙ හැරුනු විට, 1977 ජනවාරි මසදී ක්‍රියාත්මක කරන ලද ඇසුරුම් ණය සහතික ක්‍රමය හා සම්බන්ධිත කටයුතුවල වර්ධනයක් ද දක්නා ලදී.

වර්ෂය තුළදී පහත සඳහන් කාර්යයන් සඳහා රුපියල් දශලක්ෂ 12.1 දක්වා ප්‍රමාණයකට ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කරන ලදී.

**2·4 සංඛ්‍යා සටහන – මැදිකාලීන හා දිගුකාලීන ප්‍රතිමූල්‍ය ණය**

| අරමුණ | ප්‍රමාණය<br>රුපියල් දශලක්ෂ |
|---|---|
| හෝටල් ව්‍යාපෘති .. | 2·8 |
| ධීවර ව්‍යාපෘති .. | 5·6 |
| කාර්මික ව්‍යාපෘති .. | 2·2 |
| කෘෂිකාර්මික ව්‍යාපෘති .. | 1·5 |
| මුළු එකතුව .. | 12·1 |

## තේ කර්මාන්ත සංවර්ධනය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව, දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද තේ කර්මාන්තයට මුදල් ආයෝජනය කිරීම සඳහා වූ ව්‍යාපෘතීන් හඳුනා ගැනීමේ අධ්‍යයනය වර්ෂය තුළදී නිමාවට පත් කරනු ලැබීය. මෙම අධ්‍යයනය ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කරන ලදුව, විශාල තේ වගාවන් සංඛ්‍යාවක් හා සම්බන්ධ ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු, කර්මාන්තශාලා නවීකරණය සහ විදුලි බලය සැපයීම සඳහා මූල්‍යකරණයට ණය පහසුකම් සැපයීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය අගැයීම පිණිස විශේෂඥයන් පිරිසක් එවීමට එකඟත්වය පළකොට ඇත.

## ධීවර කර්මාන්තය

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර ඇතිව ධීවර අමාත්‍යාංශය විසින් කරගෙන යනු ලබන ධීවර සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙහිලා සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව තවදුරටත් සහාය වීය. මෙම යෝජනා ක්‍රමය යටතේ නොයෙකුත් වර්ගයේ ධීවර යාත්‍රා බෙදා හැරීම පිළිබඳව වූ ප්‍රගතිය පහත දක්වා ඇත.

**2·5 සංඛ්‍යා සටහන**

**ධීවර යාත්‍රා මූල්‍යකරණය**

| යාත්‍රා වර්ගය | ව්‍යාපෘතිය යටතේ නිකුත් කිරීමට ඇති යාත්‍රා ගණන | 1978 වර්ෂය තුළදී නිකුත් කරන ලද යාත්‍රා ගණන | 1976 අගෝස්තු සිට 1977 දෙසැම්බර දක්වා නිකුත් කළ මුළු යාත්‍රා ගණන |
|---|---|---|---|
| අඩි 28 | 200 | 104 | 96 |
| අඩි 38 | 30 | 24 | 6 |

ව්‍යාපෘතිය යටතේ බෙදා හැරීමට නියමිතව තිබූ සියලුම යාත්‍රාවන් සමුපකාර සමිති සහ පෞද්ගලික අංශය වෙත නිකුත් කරන ලද බව ඉහත සටහනින් පෙන්නුම් කෙරේ. මෙම යාත්‍රා මිලදී ගැනීම සඳහා ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් ණය පහසුකම් සලසනු ලැබීය. මෙම ව්‍යාපෘතිය යටතේ නිකුත් කරන ලද ධීවර යාත්‍රා රක්ෂණය කිරීම පිණිස ධීවර අමාත්‍යාංශයේ සහාය ද ඇතිව මෙම දෙපාර්තමේන්තුව විසින් රක්ෂණ ක්‍රමයක් සැලසුම් කරනු ලැබීය. යාත්‍රා අයිතිකරුවන්ගේ දායක අරමුදල් ඇතිව යාත්‍රා ආපද අරමුදල් ගිණුමක් ක්‍රියාත්මක කිරීමට විස්තරාත්මක අධ්‍යයනයකින් පසු දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලදී.

## ඇසුරුම් ණය සඳහා ඇපවීම.

වාණිජ බැංකුව විසින් භාණ්ඩ නැව්ගත කිරීමට පෙර දෙන ලද ණය සම්බන්ධයෙන්, නැව්ගත කිරීමට පෙර ගෙවුම් පිළිබඳ අවදානම් සහතික කිරීම සඳහා වූ ඇසුරුම් ණය සහතික ක්‍රමය යටතේ නිකුත් කරන ලද ඇප ඔප්පු සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩි විය. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**2·6 සංඛ්‍යා සටහන**

**ඇසුරුම් ණය සඳහා ඇපවීම**

| වර්ෂය | ක්‍රමය ආරම්භයේ සිට නිකුත් කරන ලද සහතික සංඛ්‍යාව | අනුමත සීමාවන්ගේ එකතුව රු. දශලක්ෂ | වර්ෂය අවසානයේ දී බලපැවැත්වූ සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | අනුමත කරන ලද සීමාව රු. දශලක්ෂ |
| 1977 | 41 | 22·7 | — | — |
| 1978 | 96 | 96·1 | 52 | 65·3 |

යට කී ක්‍රමය යටතේ අනුමත කරන ලද ණය සීමාවන් පිළිබඳ භාණ්ඩ අනුව වූ වර්ගීකරණය පහත දක්වා ඇත.—

**2·7 සංඛ්‍යා සටහන – ඇසුරුම් ණය සීමාවන්**

| | භාණ්ඩ වර්ගය | | ඇපවීම් සංඛ්‍යාව | අනුමත කරන ලද මුළු ණය සීමාව රුපියල් |
|---|---|---|---|---|
| 1. | ටින් කරන ලද පලතුරු හා පලතුරු යුෂ | .. | 2 | 7,10,000 |
| 2. | කෙදි වර්ග හා අනෙකුත් කෙදි නිපැයුම් | .. | 5 | 28,50,000 |
| 3. | නිම කළ ඇඳුම් | .. | 11 | 3,19,75,000 |
| 4. | කුළු බඩු | .. | 10 | 74,00,000 |
| 5. | මැණික් ස්වර්ණාභරණ, ඔපකළ දියමන්ති ආදිය | .. | 3 | 23,50,000 |
| 6. | දේශීය අමුද්‍රව්‍ය වලින් ලබා ගන්නා ලද අත්‍යාවශ්‍ය තෙල්වර්ග | .. | 1 | 7,50,000 |
| 7. | රබර් මූලික භාණ්ඩ | .. | 1 | 6,50,000 |
| 8. | සම් හා සම්භාණ්ඩ නිෂ්පාදන | .. | 2 | 8,50,000 |
| 9. | මුහුදෙන් ලබා ගන්නා නිෂ්පාදන | .. | 9 | 58,50,000 |
| 10. | ගෘහභාණ්ඩ හා අනෙකුත් ලී බඩු නිෂ්පාදන | .. | 3 | 6,09,620 |
| 11. | සුඛෝපභෝගී මුහුදු යාත්‍රා සහ ෆයිබර් ග්ලාස් යාත්‍රා | .. | 2 | 93,00,000 |
| 12. | කොට්ට පුළුන් | .. | 1 | 15,000 |
| 13. | ඖෂධ පැලෑටි සහ අමු බෙහෙත් වර්ග ආදිය | .. | 1 | 50,000 |
| 14. | රෙදි සෝදන සබන් | .. | 1 | 20,00,000 |
| | එකතුව | .. | 52 | 6,53,59,620 |

**අපනයන ණය රක්ෂණය**

1979 පෙබරවාරි මසදී ක්‍රියාත්මක වීමට නියමිත ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාව පිහිටුවීම සම්බන්ධයෙන් වූ මූලික කටයුතුවල දී දෙපාර්තමේන්තුව ඉතා සමීපයෙන් කටයුතු කරන ලදී. මෙම සංස්ථාව පිහිටුවීම සඳහා වූ ව්‍යවස්ථා සැකැසීම, නිලධාරීන් පුහුණු කිරීම සහ ලේඛණ කටයුතු, විමර්ෂනයට භාජනය වන වර්ෂය තුලදී මෙම දෙපාර්තමේන්තුව විසින් කරන ලදී. මෙම නව සංස්ථාව පිහිටුවීමෙන් පසු ඇසුරුම් ණය සහතික ක්‍රමය යටතේ දැනට කෙරෙන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම සංස්ථාව වෙත භාර දෙනු ඇත.

**සුළු කර්මාන්ත ණය සඳහා ඇපවීම**

ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් නීති පනතේ 108 වන වගන්තිය අනුව රජය වෙනුවෙන් ක්‍රියාකරමින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහායද ඇතිව, මහජන බැංකුව, ලංකා බැංකුව සහ සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් සුළු කර්මාන්තකරුවන් වෙත දෙනු ලබන ණය මුදල් ආවරණය වන සුළු කර්මාන්ත ණය සහතික ක්‍රමයක් ක්‍රියාත්මක කළේය. මෙම ක්‍රමය සැකසීම සහ එහි ක්‍රියාකාරිත්වය මෙම දෙපාර්තමේන්තුව වෙත භාර දෙනු ලැබීය. 1978 අප්‍රේල් මස ආරම්භ කරන ලද මෙම ක්‍රමය මගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහතික කරන ලද මුදල් හෝ නොගෙවා ඇති මුදල යන දෙකින් අඩු මුදලින් සියයට හැත්තෑ පහක ප්‍රමාණයක් දක්වා ඇප වනු ඇත. මෙම ක්‍රමය ක්‍රියාත්මක වූ මුල් මාස 9 තුළදී ව්‍යාපෘතීන් 79 ක් සඳහා රුපියල් දශ ලක්‍ෂ 1 · 9 ක මුදල් ප්‍රමාණයක් වෙනුවෙන් ණය සහතික නිකුත්කරන ලද අතර, අලෙවි ණය සඳහා වූ රු. 1,04,256 ක මුදලක් සඳහා ද ණය සහතික නිකුත් කරන ලදී. වර්ෂය අවසානයේදී මෙම ක්‍රමය යටතේ ණය ගෙවීම් පැහැර හැරීම් නිසා වූ අලාභ හානි සඳහා හිමිකම් පෑම් කිසිවක් නොවීය. නිකුත් කරන ලද සහතිකවල කර්මාන්ත අනුව වූ වර්ගීකරණයන් පහත දක්වේ.

## 2·8 සංඛ්‍යා සටහන

### නිකුත් කරන ලද සුළු කර්මාන්ත ණය සහතික කිරීම කර්මාන්ත අනුව

| කර්මාන්ත | | | සහතික ගණන | සහතික කරන ලද මුදල රුපියල් |
|---|---|---|---|---|
| හකුරු කර්මාන්තය | .. | .. | 10 | 3,24,950 |
| සම්බැග් කර්මාන්තය | .. | .. | 1 | 12,500 |
| කුරුඳු තෙල් කර්මාන්තය | .. | .. | 1 | 40,000 |
| හඳුන්කුරු කර්මාන්තය | .. | .. | 1 | 57,800 |
| ගඩොල් කර්මාන්තය | .. | .. | 13 | 68,700 |
| ග්‍රිල් ගේට්ටු කර්මාන්තය | .. | .. | 2 | 14,500 |
| බෙලෙක් කර්මාන්තය | .. | .. | 2 | 5,842 |
| කෙඳි කර්මාන්තය | .. | .. | 2 | 58,845 |
| ගෘහභාණ්ඩ කර්මාන්තය | .. | .. | 3 | 48,000 |
| ගුවන් විදුලි අමතර කොටස් | .. | .. | 5 | 1,33,180 |
| ස්වර්ණාභරණ | .. | .. | 2 | 12,110 |
| ඇඳුම් | .. | .. | 5 | 1,63,000 |
| වතුර පොම්ප | .. | .. | 1 | 8,684 |
| සබන් | .. | .. | 2 | 21,800 |
| ඇඳුම් මැහීම | .. | .. | 2 | 8,880 |
| ලෝහ කර්මාන්තය | .. | .. | 2 | 12,950 |
| යකඩ කම්හල් වැඩ | .. | .. | 1 | 1,851 |
| මැලියම් නිෂ්පාදනය | .. | .. | 1 | 45,000 |
| තෙල් සිඳීම | .. | .. | 1 | 2,817 |
| කඩදාසි කෝප්ප නිෂ්පාදනය | .. | .. | 1 | 3,509 |
| කොඩි මුද්‍රණය කිරීම 1 | .. | .. | 1 | 10,000 |
| ලී කර්මාන්තය | .. | .. | 2 | 7,606 |
| ලොරි බොඩි නිෂ්පාදනය | .. | .. | 1 | 25,000 |
| ලියවන පට්ටල් වැඩ | .. | .. | 3 | 1,28,100 |
| වී කෙටීමේ කර්මාන්තය | .. | .. | 2 | 2,02,000 |
| උක් කර්මාන්තය | .. | .. | 4 | 1,22,825 |
| බතික් කර්මාන්තය | .. | .. | 1 | 4,500 |
| රබර් කර්මාන්තය | .. | .. | 2 | 1,08,920 |
| රබර් මිශ්‍රිත කොහු මෙට්ට නිෂ්පාදනය | .. | .. | 1 | 55,000 |
| ගල් කැඩීමේ කර්මාන්තය | .. | .. | 1 | 99,000 |
| ඉරට සහ කෙඳි කොහු නිෂ්පාදනය | .. | .. | 1 | 43,400 |
| බීඩි නිෂ්පාදනය | .. | .. | 1 | 8,000 |
| පොත් බැඳීමේ කර්මාන්තය | .. | .. | 1 | 4,180 |
| බුමුතුරුණු නිෂ්පාදනය | .. | .. | 1 | 15,000 |
| හතු නිෂ්පාදනය | .. | .. | 1 | 7,000 |
| තේ පෙට්ටි නිෂ්පාදනය | .. | .. | 1 | 15,000 |
| පාවහන් නිෂ්පාදනය | .. | .. | 1 | 4,000 |
| ගැල්වනයිස් කරන ලද බාල්දි නිෂ්පාදනය | .. | .. | 1 | 30,320 |
| වීදුරු කර්මාන්තය | .. | .. | 1 | 9,440 |
| ධීවර යාත්‍රා | .. | .. | 1 | 116,200 |
| එකතුව | .. | .. | 86 | 20,10,410 |

### මුල්‍ය කළමනාකරණය පිළිබඳ සමීක්ෂණය

තවද, මෙම දෙපාර්තමේන්තුව 1978 වර්ෂයේදි "සුළු පරිමාන කර්මාන්තයන්හි මූල්‍ය කළමනාකරණය" පිළිබඳව සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ මූලික පරමාර්ථය වූයේ සුළු පරිමාන අංශයේ මූල්‍යකරණයෙහි ලා මූලික හා පශ්චාත් අවස්ථාවලදී ඇතිවන ප්‍රශ්න හඳුනාගැනීම හා එම අංශයේ පුහුණු කිරීම් අවශ්‍යතාවයන් පිළිබඳ අවබොධ කරගැනීමයි. තම යන්ත්‍ර සූත්‍ර සඳහා රු 5,00,000/- හෝ ඊට අඩු මුදලක් ආයෝජනය කරන ලද, ආයතන 30 ක් මෙම සමීක්ෂණය සඳහා තෝරාගනු ලැබිය. සමීක්ෂණය මගින් වැදගත් කරුණු දෙකක් හෙළි විය.

(අ) සාර්ථකත්වයක් ලබාගැනීමෙන් පසුව ඇතැම් ආයතන බැංකුවලින් සීමිත පහසුකම් ලබාගෙන ඇති නමුදු ආදශියට ඇතුලත් කිසිම ආයතනයක් මූලික අවස්ථාවේදී, බැංකු මූල්‍ය පිළිසරණ ලබා නැත. බැංකු ණය ලබාගැනීම මෙසේ සීමිතව පැවතීම බැංකු අනුගමනය කරන ගතානුගතික සුරැකුම් මත ණය දීමේ ප්‍රතිපත්තිය පෙන්නුම් කරයි.

(ආ) ආදශීයේ එකම කුඩා කර්මාන්තකරුවෙකු හෝ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුවීමේ අවශ්‍යතාවයක් පිළිබඳව සලකා බලා නොමැත. මෙම කාලය තුළ කුඩා කර්මාන්තකරුවන්ගේ මෙහෙයුම් පරිමානයේ වර්ධනය සුළුවෙන් සිදු වූ බැවින් මූල්‍ය කළමනාකරණය වර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් නොපෙණෙන්නට ඇත. කෙසේ වෙතත් මූල්‍ය කළමණාකරණය පිළිබඳ ඔවුන්ගේ දැනුම මඳවීම බැංකු ණය ලබාගැන්ම ඔවුනට වඩා දුෂ්කර වීමට එක් හේතුවක් වූ බව සැලකීම හේතු සහගතය.

## උක් වගා ණය පිළිබඳ සමීක්ෂණය

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ හා සංවර්ධන ලේකම් වරුන්ගේ කමිටුවේ ඉල්ලීම පිට මෙම දෙපාර්තමේන්තුව මහජන බැංකුවේ, ලංකා බැංකුවේ හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ද සහාය ඇතිව ණය අයථා ලෙස යෙදවීම කෙතරම් දුරට සිදුවේද යන්න තීරණය කිරීමේ අදහසින් අම්පාර දිස්ත්‍රික්කයේ උක් වගා ණය පිළිබඳව සමීක්ෂණයක් පවත්වන ලදී මෙම සමීක්ෂණයෙහි ප්‍රතිඵල සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර ඇත.

## ජාතික සංවර්ධන බැංකුව

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් මහ බැංකුව සමග ඇතිකර ගනු ලැබූ වැඩ පිළිවෙලක් යටතේ, සංවර්ධන ලේකම්වරුන්ගේ කමිටුව මගින් ඉදිරිපත් කරන ලද රාජ්‍ය අංශයේ ව්‍යාපෘතීන් කිහිපයක් අගැයීම් ද මෙම දෙපාර්තමේන්තුව විසින් කරන ලදී. මෙම වැඩ පිළිවෙල යටතේ, 1978 අයවැය ලේඛනයෙහි ජාතික සංවර්ධන බැංකුවේ රජයේ ප්‍රාග්ධන දායක දීමනාව වශයෙන් නියම කරන ලද රුපියල් දශලක්ෂ 390 මහ බැංකුව වෙත තැන්පත් කෙරුන අතර රාජ්‍ය අංශයේ සංස්ථාවල ප්‍රාග්ධන වියදම සඳහා මෙම අරමුදලෙන් කෙරෙන ගෙවීම් මෙම දෙපාර්තමේන්තුවේ අගැයීමට භාජනය කරන ලදී.

සමාලෝචනයට භාජනයවූ වර්ෂය තුළදී මෙම දෙපාර්තමේන්තුව විසින් 1978 නොවැම්බර් මාසයේ දී සම්මත කරන ලද ජාතික සංවර්ධන බැංකුව පිහිටුවීමට අදාල නීති කෙටුම්පත් යෝජනා සකස් කරන ලදී.

## රාජ්‍ය ණය

මුදල් වර්ෂය අවසානයේදී නොබේරූ දළ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් 30,94 98 18,155 ක්වූ අතර රුපියල් 16,36,75,54,626 ක දේශීය ණයවලින් හා රුපියල් 14,58,22 63,529 ක විදේශීය ණයවලින් මෙම ප්‍රමාණය සමන්විත විනි. විමසුමට ලක්වූ වර්ෂය තුලදී දළ රාජ්‍ය ණයෙහි වැඩිවීම රුපියල් 5,96,39,17,272 ක් වූ අතර එහි දේශීය ණය කොටස රුපියල් 1,97,51,74,900 ක්ද විදේශීය ණය කොටස රුපියල් 3,98,87,42,372 ක්ද විය.

1978 වර්ෂය අවසානයේ දී රාජ්‍ය ණය සමන්විත වූයේ පහත දැක්වෙන අන්දමිනි.

2·9 සංඛ්‍යා සටහන – රාජ්‍ය ණයෙහි සංයුතිය

| ණය වර්ගය | | | ප්‍රමාණය—රුපියල් |
|---|---|---|---|
| 1. අරමුදල් සහ දේශීය ණය | | .. | 12,74,75,89,444 |
| (I) රුපියල් ණය | .. | .. | 12,04,90,61,6C0 |
| (II) පරිපාලන ණය ගැනීම් | .. | .. | 69,84,54,005 |
| (III) ජාතික සංවර්ධන තිළිණපත් | .. | .. | 73,839 |
| 2. චල ණය | .. | .. | 3,61,99,65,182 |
| (I) භාණ්ඩාගාර බිල්පත් | .. | .. | 2,63,50,00,000 |
| (II) බද්ධ සංචිත සහතික | .. | .. | 2,94,65,182 |
| (III) මහ බැංකු අත්තිකාරම් | .. | .. | 95,55,00,000 |
| (IV) විශේෂ ණය | .. | .. | — |
| 3. විදේශීය ණය | .. | .. | 14,58,22,63,529 |
| (I) යෝජනා ක්‍රම ණය | .. | .. | 4,83,30,51,153 |
| (II) ද්‍රව්‍යාධාර ණය | .. | .. | 8,96,99,26,870 |
| (III) වෙනත් | .. | .. | 77,92,85,506 |
| 4. මුළු රාජ්‍ය ණය | .. | .. | 30,94,98,18.155 |

දේශීය ණය

රුපියල් ණය

රජයේ අයවැය පිළිවෙල යටතේ 1978 මුදල් වර්ෂය තුළදී දේශීය බැංකු නොවන මාර්ගවලින් රුපියල් දශලක්ෂ 17.50 ක මුදලක් ලබාගැනීමට බලාපොරොත්තු විය. පහත දක්වෙන මාර්ගවලින් මෙම මුදල ලැබී ඇත.

2·10 සංඛ්‍යා සටහන

රුපියල් ණය සඳහා දායක දීමනා

| දායකයා | | | ප්‍රමාණය රු. දශලක්ෂ | සියයට ගණන |
|---|---|---|---|---|
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | .. | .. | 378·12 | 21·6 |
| ඒකාබද්ධ ආයෝජන අරමුදල | .. | .. | 590·13 | 33·7 |
| සේවක අර්ථසාධක අරමුදල | .. | .. | 576·39 | 32·9 |
| රක්ෂණ සංස්ථාව | .. | .. | 150·36 | 8·6 |
| වෙනත් | .. | .. | 55·00 | 3·2 |
| එකතුව | .. | .. | 1,750·00 | 100·0 |

රුපියල් දශලක්ෂ 1750 ක් වූ දිගු කාලීන රුපියල් ණය ප්‍රමාණය එකක් රුපියල් දශලක්ෂ 200 බැගින් වූ ණය මුදල් අටකින් හා රුපියල් දශලක්ෂ 150 ක ණය මුදලකින් සමන්විත විය. 1978 ජනවාරි මාසයේදී ඇරඹුනු ණය වැඩ සටහන මුළු මුදල එකතුවීමෙන් පසු 1978 නොවැම්බර් මාසයේ අවසන් විය. රාජ්‍ය අංශයේ ආයෝජනය මුදල් අවශ්‍යතාවයන් අනුව ණය වැඩ සටහන සකස් කෙරිණි.

මෙම ණය ලබාගෙන ඇත්තේ 1977 අංක 25 දරණ විසර්ජන පනත යටතේය. එහි දක්වා ඇති පරිදි රුපියල් දශලක්ෂ 5155 වූ ණය සීමාව තුළ මෙම ණය ලබාගෙන ඇත.

(අ) පරිපාලන ණය

ජර්මනිය, ඉරානය සහ ලිබියාව යන රටවල් විසින් මහ බැංකුව හා ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (ඒකාබද්ධ අපනයන) සංස්ථාව මගින් රජයට දෙන ලද ණය මුදල් තුනක් පරිපාලන ණය යටතේ වර්ග කර ඇත. මෙකී ණය මුදල්වල මුළු රුපියල් වටිනාකම රුපියල් 698,454,005 ක් විය.

ජාතික සංවර්ධන තිළිණපත්

1961 අංක 65 දරණ මුදල් පනතේ 19 (1) වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් විසින් ජාතික සංවර්ධන තිළිණපත් නිකුත් කරනු ලැබේ. වර්ෂය තුළදී මෙම ගණුදෙනු සිදු නොවූ බැවින් නොබේරූ තිළිණපත් 1977 දෙසැම්බර් 31 වැනි දින පැවති මට්ටමෙහිම නොවෙනස්ව පැවතිණි.

(ආ) භාණ්ඩාගාර බිල්පත්

වර්ෂය තුළදී අනුදත් භාණ්ඩාගාර බිල්පත් සීමාව රුපියල් දශලක්ෂ 3000 ක් මට්ටමෙහිම නොවෙනස්ව පැවතිනි. 1978 දෙසැම්බර් අවසාන වන විට නිකුත් කරනු ලැබ නොබේරා තිබුන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2635 ක් විය. මේ අනුව වර්ෂය තුලදී රුපියල් දශලක්ෂ 135 ක වැඩිවීමක් වාර්තා වී ඇත. බැංකු අංශය සතුව තිබුනු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2199.9 ක්වූ අතර මහ බැංකුව සතු වූ කොටස රුපියල් දශලක්ෂ 2037.9 ක් විය. රාජ්‍ය නියෝජ්‍යත්වයන් සතු වූ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 270 ක් වූ අතර වෙනත් අය සතුව රුපියල් දශලක්ෂ 165.1 පැවතිනි.

(ඉ) **බද්ධ සංචිත සහතික**

වර්ෂය සඳහා අනුදත් බද්ධ සංචිත සහතික සීමාව රුපියල් දශලක්ෂ 750 ක් වූ අතර 1978 දෙසැම්බර් අවසානයට නිකුත් කරන ලද ප්‍රමාණය රුපියල් 722,983,200 ක් විය. මෙම ප්‍රමාණයෙන්, මුළු වශයෙන් රුපියල් 693,518,018 ක සහතික ආපසු පවරා දී ඇති අතර රුපියල් 29,465,182 ක් බේරීමට ඉතිරිව ඇත. වර්ෂය අවසාන වන විට බද්ධ සංචිත සහතික අයිතිය ශුද්ධ වශයෙන් රුපියල් 1,10,95,380 කින් අඩු වී ඇත.

(ඊ) **මහ බැංකු අත්තිකාරම් සහ විශේෂ ණය**

මහ බැංකු අත්තිකාරම්වල රුපියල් 411,600,000 ක වැඩිවීම ද විශේෂ ණය වල රුපියල් 73,509,125 ක අඩුවීමද, සැළකිල්ලට ගත් විට වර්ෂය තුළදී වල ණයෙහි ශුද්ධ වැඩිවීම රුපියල් 461,995,494 ක් විය.

**විදේශීය ණය**

1978 මුදල් වර්ෂය අවසානයට පරිපාලන ණය ගැනීම් හැර පියවීමට ඉතිරිව තිබුන මුලු විදේශ ණය ප්‍රමාණය රුපියල් 14,582,263,529 ක් විය. මෙමගින් වර්ෂය තුළදී රුපියල් 3,988,742,372 ක වැඩිවීමක් වාර්තා වී ඇත. මෙම ප්‍රමාණයට විනිමය අනුපාතිකයන්හි අඩු වැඩිවීම් නිසා රුපියල් ශේෂයෙහි වූ ප්‍රතිශෝධනය මගින් උද්ගත වූ රුපියල් 773,026,499 ක අතිරේක ණය වගකීමක් ද ඇතුලත් වෙයි. 1978 දී රුපියල් දශලක්ෂ 4892 ක නව ණය නිකුතුන් සඳහා ගිවිස ගන්නා ලදී. මෙම ප්‍රමාණයෙන් රුපියල් දශලක්ෂ 1680 ක් බහුපාර්ශ්වීය මාර්ගවලින් ද රුපියල් දශලක්ෂ 3211·9 ක් ද්විපාර්ශ්වීය මාර්ගවලින් ද ලැබේ. වර්ෂය තුළදී යෝජනාක්‍රම ණය යටතේ කරන ලද ගෙවීම් රුපියල් 1,584,442,259 ක් වූ අතර ඉන් රුපියල් 648,567,536 ක් බහුපාර්ශ්වීය මාර්ග යටතේ ද රුපියල් 935,874,723ක් ද්විපාර්ශ්වික මාර්ග යටතේ ද ගෙවා ඇත.

ද්‍රව්‍ය ආධාර ණය යටතේ වර්ෂය තුළදී රුපියල් 1,342,996,096 ක් ගෙවන ලද අතර එම ප්‍රමාණය මුලුමනින්ම සමන්විත වූයේ ද්විපාර්ශ්වීය මාර්ග යටතේ වූ ණය මුදල් වලිනි.

**ණය සේවාව**

(අ) ක්‍රමක්ෂය : වර්ෂය තුළදී කල්පිරුනු රුපියල් ණය නිකුතුන් තුනකින් බේරන ලදුව 1958 දී ලංකා සංවර්ධන ණය පනත යටතේ ලබාගත් රුපියල් දශලක්ෂ 20 ක් සඳහා වූ සියයට 3¼ 1974—1978 ණය මුදල එය බේරීම සඳහා පිහිටුවන ලද නිදන් අරමුදලින් බේරුම් කරන ලදී. මෙම ණය බේරීමෙන් පසුව නිදන් අරමුදලෙහි වූ රුපියල් 1,068,204·45 ක අතිරික්තය ඒකාබද්ධ අරමුදලට බැර කෙරිනි. 1952 දී රුපියල් 65,525,600 ක් ද 1955 දී ජාතික සංවර්ධන ණය පනත යටතේ රුපියල් 7,054,000 ක්ද යන ආකාරයෙන් ලබාගත් ඉතිරි ණය නිකුතුන් දෙක බේරීම සඳහා නිදන් අරමුදල් පිහිටුවා නොතිබුන හෙයින් ඒකාබද්ධ අරමුදලින් ලබාගත් මුදල්වලින් ඒවා බේරන ලදී.

1978 වර්ෂය තුළදී රුපියල් 501,366,091 ක විදේශ ණය බේරා ඇත. මෙයින් රුපියල් 154,013,110 ක් යෝජනා ක්‍රම ණය වෙනුවෙන් ද, රුපියල් 347,352,981 ක් ද්‍රව්‍යාධාර ණය වෙනුවෙන් ද ගෙවා ඇත.

(ආ) **පොළී ගෙවීම්**

විමර්ශනයට ලක්වූ කාලය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් සේවා කරන ලද දේශීය ණය ප්‍රමාණය රුපියල් 1,054,724,639 ක් විය. මෙම ප්‍රමාණයෙන් සියයට 79·6 ක් ගෙවන ලද්දේ රුපියල් ණය සඳහා පොලී වශයෙනි. ණය වර්ගය අනුව පොලී ගෙවීම් පහත දක්වා ඇත.

**2·11 සංඛ්‍යා සටහන – පොළී ගෙවීම**

| | | | ප්‍රමාණය | සියයට ගණන |
|---|---|---|---|---|
| 1. භාණ්ඩාගාර බිල්පත් | .. | .. | 173,919,871 | 16·5 |
| 2. බදු සංචිත සහතික | .. | .. | 986,391 | 0·1 |
| 3. රුපියල් ණය | .. | .. | 839,929,008 | 79·6 |
| 4. පරිපාලන ණය | .. | .. | 39,889,369 | 3·8 |
| (අ) අයිරානියානු ණය | .. | ., | (36,883,200) | — |
| (ආ) කේ. ෆැ./ඩැට. ජර්මනි | .. | .. | (3,006,169) | 2 — |
| මුළු ගණන | .. | .. | 1,054,724,639 | 100·0 |

විදේශීය ණය වෙනුවෙන් රුපියල් 28,50,31,966.56 ක පොළී ගෙවනු ලැබීය.

(අ) **නිදන් අරමුදල :** රුපියල් ණය පියවීම සඳහා පිහිටුවන ලද නිදන් අරමුදලේ මුළු වටිනාකම වසර අවසානයේ දී රු. 3,204,092,369·77 ක් විය. වසර තුළදී වූ රු. 65,22,83,996·23 ක වැඩිවීමක් මින් පිළිබිඹු වෙයි. එම වැඩි වීම පහත සඳහන් පරිදි සකස් වී ඇත.

| | | | |
|---|---|---|---|
| 1978 වර්ෂය තුළදී නිදන් අරමුදල් දායක දීමනා | — | රු. | 41,73,14,358·50 |
| ආයෝජනවලින් ශුද්ධ ආදායම | — | රු. | 25,60,37,842·18 |
| එකතුව | — | රු. | 67,33,52,200·68 |

අඩු කරන්න
ණය පියවීම සඳහා
උපයෝගී කරගත් ප්‍රමාණය — රු. 2,00,00,000·00
ණය පියවීමෙන් පසුව
ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද
නිදන් අරමුදලේ අතිරික්තය — රු. 10,68,204·45 — රු. 2,10,68,204·45

රු. 65,22,83,996·23

**අර්ධ රාජ්‍ය ආයතනයන් මගින් ණය ගැනීම**

1978 වර්ෂය තුළදී අළුතින් ජාතික නිවාස ණයකර නිකුත් නොකරන ලදී. 1958 වර්ෂයේ දී නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 10 ක් වටිනාකම ඇති ණයකර නිදන් අරමුදලේ මුදල්-වලින් ආපසු ගෙවන ලද අතර, අරමුදලේ අතිරික්තය ජාතික නිවාස අරමුදල් ගිණුමට බැර කරන ලදී. 1978 වර්ෂය අවසානය වන විට නිකුත් කරනු ලැබ පියවීමට ඉතිරිව තුබූ ජාතික නිවාස ණයකරවල වටිනාකම රුපියල් දශලක්ෂ 81 ක් විය. ජාතික නිවාස ණයකර බේරීම සඳහා පිහිටුවන ලද නිදන් අරමුදලේ වෙළෙඳ වටිනාකම රු. 3,98,78,019 ක් පමණ විය. මෙයින් පිළිබිඹු වනුයේ 1978 වසර තුළදී වූ රු. 15,06,408 ක අඩුවීමකි.

1978 වසර තුළදී රජයේ උකස් බැංකු ණයකර බේරීම සඳහා නිකුතුන් නොවිය. නිකුත් කරනු ලැබ බේරීමට ඉතිරිව තිබුණු ණයකරවල මුළු වටිනාකම වසර අවසානයේ දී රු. 3,22,50,000 ක් විය.

## විනිමය පාලනය

වෙළෙඳ හා ගෙවීම් කටයුතු නිදහස් කිරීමට රජය තීරණය කිරීමෙන් අනතුරුව විනිමය පාලන විධිවිධාන කීපයක්ම, 1977 නොවැම්බර් 15 වැනි දිනට පසුව ලිහිල් කරන ලදී. එසේම ශීර්ෂ රාශියක් සම්බන්ධයෙන්ම ලැබීම් හා ගෙවීම් අනුමත කිරීමේ කාර්යය ද වෙළෙඳ බැංකු වෙත පවරා දෙන ලදී. ප්‍රධාන ලිහිල් කිරීම පිළිබඳ විස්තර පහත දක්වේ. මින් සමහරක් 1979 ආරම්භයේ සිට බලපැවැත්විනි.

විනිමය පාලනය ලිහිල් කිරීම

(1) **නිවාඩු ගමන් :** ඉන්දියානු කලාපයේ රටවලට (බංග්ලාදේශය, බුරුමය, ඉන්දියාව, මාලදිවයින්, නේපාලය, පකිස්ථානය සහ තායිලන්තය) සහ අනෙකුත් රටවලට නිවාඩු ගමන් සඳහා දෙනු ලබන ගමන් ගාස්තුව හා මූලික විනිමය දීමනාව වැඩි කරන ලද අතර එය පිළිවෙලින් අවුරුදු 2 කට හා 4 කට වරක් බැගින් අනුමත කිරීමට ද ඉඩ සලසා ඇත.

(2) **නිල, ව්‍යාපාරික සහ වෛද්‍ය ගමන් :** නිල, ව්‍යාපාරික සහ වෛද්‍ය ගමන් සඳහා සීමිත ප්‍රමාණයකින් අනුමත කරනු ලැබූ, ගමන් ගාස්තු සහ විනිමය ප්‍රමාණයන් වඩාත් නිදහස් පදනමක් මත ලබාගැනීමට සැලැස්විනි. නිල ගමන් සඳහා විවිධ රටවලට අදාල වූ විනිමය ප්‍රමාණයන් වැඩි කෙරෙන අතර වෙළඳ සමාගම්වල සභාපති, අධ්‍යක්ෂ, හවුල්කරු හෝ අයිතිකරුගේ නිර්දේශයක් මත ව්‍යාපාරික ගමන් සඳහා නිදහස් ලෙස විනිමය අනුමත කරනු ලැබීය. රෝහල් ගාස්තුද ඇතුලත්ව වෛද්‍ය කටයුතු සඳහා දෙනු ලබන විනිමය ප්‍රමාණයන් වැඩි කරන ලදී.

(3) **අධ්‍යාපනය :** පිළිගත් විශ්ව විද්‍යාලයන්හි උපාධි හා පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගෙනීම කටයුතු උදෙසාත් ශ්‍රී ලංකාවේදී ලබාගත නොහැකි විශේෂඥ ශිල්පිය පුහුණුව ලබා ගැනීම උදෙසාත් එතෙර අධ්‍යාපනය සඳහා විනිමය මුදා හරින ලදී.

(4) **ලාභ හා ලාභාංශ ප්‍රේෂණය කිරීම :** අනේවාසික කොටස් හිමියන් වෙත ලාභ හා ලාභාංශ ප්‍රේෂණය කිරීම කලින් සීමිත පදනමක් මත කෙරුණු අතර එය පූර්ණවශයෙන් කිරීමට ඉඩ සලසන ලදී.

(5) **විගාමිකයනට විනිමය :** විගාමිකයනට දෙනු ලබන විනිමය ප්‍රමාණයන් වැඩි කරන ලදී. පෞද්ගලික පරිහරණයට අදල භාණ්ඩ අපනයනය කිරීම නිදහස් කරන ලදී.

(6) **අනේවාසික ආවෘත ගිණුම් :** අනේවාසික ආවෘත ගිණුම්හි තැන්පත්කොට තුබූ මුදල්, ප්‍රේෂණය කිරීමට කලින් ඉඩ නොලැබිණි. මෙම මුදල එක් ගිණුමකට රු. 1,00,000 ක උපරිමයක් දක්වා ප්‍රේෂනය කිරීමට අවසර දෙන ලදී.

(7) **පෞද්ගලික ස්වර්ණාභරණ අපනයනය :** එතෙර බලා යන පුද්ගලයන්ට බලපත්‍රයක් නොමැතිව ගෙන යා හැකි පෞද්ගලික ස්වර්ණාභරණවල වටිනාකම වැඩි කරන ලදී.

(8) **ව්‍යවහාර මුදල් නැවත මාරු කිරීම :** සංචාරකයන්ගේ සහ මාර්ගස්ථ මගීන්ගේ වියදම් නොකොට ඉතිරි වන රුපියල් මුදල් විදේශීය මුදල්වලට නැවත පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් වෙළෙඳ බැංකුවලට පනවා ඇති උපරිමය වැඩි කරන ලදී.

(9) **වැඩිපුර ගමන් බඩු :** වැඩිපුර ගමන් බඩු වෙනුවෙන් කරන අයකිරීම සඳහා මුදා හරිනු ලබන විනිමය ප්‍රමාණය දෙගුණ කරන ලදී.

වෙළෙඳ බැංකු වලට බලය පැවරීම

පහත සඳහන් කරුණු අනුමත කිරීමේ බලය වෙළෙඳ බැංකුවලට පවරන ලදී.

(1) නිවාඩු ගමන්, ව්‍යාපාර, නිල කටයුතු සහ වෛද්‍ය ප්‍රතිකාර සම්බන්ධයෙන් ගමන් ගාස්තු හා විනිමය.

(2) වෘත්තියමය ආයතන වලට ගෙවනු ලබන දයක මුදල්, විදේශීය විභාග ගාස්තු, තැපැල් මාර්ගික අධ්‍යාපන පාඨමාලා ගාස්තු ගෙවීම.

(3) විගාමිකයන්ගේ ගමන් ගාස්තු හා වැඩිපුර ගමන් බඩු ගාස්තු, විනිමය, පෞද්ගලික ස්වර්ණාභරණ හා පෞද්ගලික පරිහරන භාණ්ඩ සහ නැව් කුලී.

(4) අනේවාසික කොටස්කරුවන්ගේ ලාභ හා ලාභාංශ ප්‍රේෂනය කිරීම.

(5) ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත්වන පුද්ගලයන් හා ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කොට ඇති සමාගම් මගින් අනේවාසික ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම. එසේවුවද මෙකී ගිණුම්හි හර හා බැර ශීර්ෂයන් සමහරක් විනිමය පාලන අනුමැතියට යටත් වේ.

(6) විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය අවශ්‍යවන්නා වූ ඒවා හැර අනෙකුත් අපනයන බලපත්‍ර.

(7) නියෝජිතවරුන්ට සහ/හෝ ගැනුම්කරුවන්ට අපනයන කොමිස් ප්‍රේෂණය.

(8) විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය අවශ්‍ය වන්නාවූ ඒවා හැර, ණයවර ලිපි මත කෙරෙන අනෙකුත් ආනයන ගෙවීම්.

(9) ප්‍රේෂණකරු විසින් නැවත ඉල්ලා සිටිය හොත්, මෙරටට කෙරෙන ප්‍රේෂනයන් ප්‍රේෂන-කරුට ආපසු යැවීම.

(10) ශ්‍රී ලංකාවාසීන්ගේ ද මෙහි පැමිණෙන සංචාරකයන්ගේ ද නමින් සංචාරක වියදම් සඳහා ලැබෙන ප්‍රේෂනයන් සම්බන්ධයෙන් විදේශීය විනිමය නිකුත් කිරීම.

(11) " විදේශීය ගිණුම් " වලින් කෙරෙන ප්‍රේෂනයන් හා ගමන් ගාස්තු.

(12) නේවාසික නොවන සංචාරකයන් විසින් ශ්‍රී ලංකා රුපියල්වලින් ගමන් ගාස්තු ගෙවීම. එසේ වුවද එකී ගමන් ගාස්තුවලට සරිලන පරිදි ප්‍රමාණවත් විදේශීය විනිමය ප්‍රමාණයක් මාරුකර ඇති බවට සාක්ෂි නේවාසික නොවන සංචාරකයන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

## සේවක අර්ථසාධක අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පණත යටතේ, දායක දීමනා හා අධිභාර මුදල් ද, අරමුදලේ මුදල් ආයෝජනයෙන් උපචිත වෙනත් ආදායම් ලැබීම ද, පණතේ 5 වැනි වගන්තියේ නියමයනට අනුව මෙහි මුදල් පිළිබඳව අනෙකුත් කාර්යයන් ඉටු කිරීම ද නොකඩවා කරගෙන ගියේය. 1978 වර්ෂය තුළ එහි මෙහෙයවුම් පිළිබඳ කෙටි සටහනක් මෙහි පහත දැක්වේ.

### සාමාජිකත්වය හා ලියාපදිංචි කළ සේවායතනයන්

කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද දත්තයනට අනුව ලියාපදිංචි කළ සේවායතන සංඛ්‍යාව 1977 වර්ෂයේ 81,959 සිට 1978 වර්ෂය තුළදී 85,656 ක් දක්වා වැඩි විය. මෙය සියයට 4·5 ක වැඩිවීමකි. මෙම සේවායතන යටතේ ලියාපදිංචි වූ සාමාජික සංඛ්‍යාව, 1978 වර්ෂාවසානයේදී 1,386,591 ක් වූ අතර, 1977 දී 1,344,528 ක් වූයේය. මෙය සියයට 3·1 ක වැඩිවීමකි.

### දායක දීමනා

1978 වර්ෂය තුළ අරමුදලට ලැබුණු දායක දීමනා රුපියල් දශලක්ෂ 524 ක් වූ අතර, එය 1977 දී රුපියල් දශලක්ෂ 305 ක් විය. මේ අනුව කලින් වර්ෂයේ දායක දීමනා මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 219 ක නැතහොත් සියයට 72 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

1978 වර්ෂාවසානය වනවිට සාමාජිකයන්ගේ ශේෂය රුපියල් දශලක්ෂ 3263 ක් වූයේය. මෙය 1977 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 687 ක නැතහොත් සියයට 27 ක වැඩිවීමකි.

### ආයෝජන

1978 වර්ෂය තුළදී අරමුදල විසින් රුපියල් දශලක්ෂ 642 ක මුදලක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන ලදී. මෙය 1977 වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 244 ක නැතහොත් සියයට 61 ක වැඩිවීමකි. 1978 වර්ෂය අවසානයේ දී අරමුදලේ ආයෝජන එකතුව රුපියල් දශලක්ෂ 3133 ක් වූ අතර, මෙය 1977 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 2491 ව සීමා විය

**ආයෝජන වලින් ලත් ආදායම**

1978 වර්ෂය තුළ අරමුදලේ ආයෝජනවලින් ලත් ආදායම රුපියල් දශලක්ෂ 206 ක් වූ අතර, 1977 දී මෙම ආදායම රුපියල් දශලක්ෂ 160 ක් විය. මෙය 1978 වර්ෂය තුළ රුපියල් දශලක්ෂ 46 ක නැතහොත් සියයට 29 ක වැඩිවීමක් නියෝජනය කරන අතර, කලින් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 28 ක නැතහොත් සියයට 21 ක වැඩිවීමකි. මෙයට හේතුන් වූයේ, වැඩි වූ දායක මුදල් ප්‍රමාණයක් ආයෝජනය කිරීමත්, අරමුදල් ආයෝජනය මත උපැයූ ආදායම් ප්‍රති ආයෝජනය කිරීමත්ය.

**ප්‍රතිලාභ**

1978 වර්ෂය තුළදී ප්‍රතිලාභ ආපසු ගෙවීම මගින් ගෙවන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 122 ක් වූයේය. 1977 වර්ෂය සමඟ සසඳන කල්හි මෙය රුපියල් දශලක්ෂ 33 ක වැඩිවීමක් නියෝජනය කරයි. 1978 වර්ෂය තුළ 42,526 ප්‍රතිලාභ ගෙවනලද අතර, 1977 දී 41,157 ක් ගෙවිය.

**සාමාජිකයන්ගේ ශේෂයන් මත පොළිය**

සේවක අර්ථසාධක අරමුදල මගින්, අරමුදලට අයත් මුදල් ආයෝජන කිරීමෙන් ලැබෙන ආදායමෙන් සාමාජිකයන්ගේ ශේෂයන් මත පොළිය ගෙවිය යුතු වේ. සාමාජිකයන්ගේ ශේෂයන් මත ගෙවිය යුතු පොලී අනුපාතය තවදුරටත් සියයට 7·5 ක්ව නොවෙනස්ව පැවතිණ. 1978 වාර වර්ෂාවසානයේදී සාමාජිකයන්ගේ ශේෂයන් මත ගෙවිය යුතු වූ පොළිය රුපියල් දශලක්ෂ 228 ක්වූ අතර, 1977 දී මෙම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 180 ක් විය. මෙය කලින් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 48 ක් නැතහොත් සියයට 27 ක වැඩිවීමකි.

වර්ෂය අවසන් වීමේදී සාමාජිකයන්ගේ බැරට ඇති ශේෂයන් මත පොළිය ගෙවනු ලබන අතර, ඉන් අනතුරුව මුළු මුදල මත පොළිය උපචිතය වෙයි. ඒ අනුව ලැබෙන පොළිය වැල් පොළී පදනමට හැරේ. ඒ හැර, වර්ෂය අවසානයේ දී සාමාජිකයාගේ බැරට ඇති ශේෂය මත මුළු වර්ෂයම සඳහා පොළිය ගෙවන අතර, එහි ලා සාමාජිකයාගේ ගිණුමට, අරමුදල වෙත එම ශේෂයේ කුමන හෝ කොටසක් (දායක මුදල් නියෝජනය කැරෙන) ලැබුණු දිනය සැලකිල්ලට ගනු නොලැබේ. නිදසුනක් වශයෙන්, වර්ෂයේ ජනවාරි මාසයේදී ලැබුණු දායක මුදලට ලැබෙන පරිද්දෙන්ම එම වසරේ දෙසැම්බර් මාසයේදී ලැබෙන දායක මුදලට ද මුළු වර්ෂයම සඳහා පොළිය ලැබේ. එබැවින් ක්‍රියාත්මක වන පොළී අනුපාතය සියයට 7·5 ට වඩා තරමක් අධික පොළියකි.

**සේ. අ. අ. සංඛ්‍යා ලේඛන 1977/78**

| | 1977 | 1978 |
|---|---|---|
| 1. ලියාපදිංචි වී ඇති සේවායතන සංඛ්‍යාව .. | 81,959* | 85,656* |
| 2. ලියාපදිංචි වී ඇති සාමාජික සංඛ්‍යාව .. | 1,344,528* | 1,386,591* |
| 3. ලැබුණු දායක මුදල්—රුපියල්** .. | 304,838,236 | 523,757,501 |
| 4. ආයෝජන—රුපියල් .. | 397,981,740 | 641,964,728 |
| 5. ආයෝජන මත ලත් ආදායම—රුපියල් .. | 160,222,583 | 206,127,224 |
| 6. ප්‍රතිලාභ ගෙවීම—රුපියල් .. | 89,357,790 | 122,012,108 |
| 7. ප්‍රතිලාභ සංඛ්‍යාව .. .. | 41,157 | 42,526 |
| 8. පොළී අනුපාතිකය(%) .. | 7·5 | 7·5 |
| 9. සාමාජිකයන්ගේ ශේෂයන් මත පොළිය—රුපියල් .. | 179,717,325 | 227,641,001 |

මූලය: * කම්කරු දෙපාර්තමේන්තුව.

** පැවරුම් සඳහා අවිනිශ්චිත ගිණුමට බැර කරන ලද දායක මුදල් හැර.

## සංඛ්‍යා ලේඛන

දත්ත රැස්කිරීමේ පුළුල් වැඩ සටහනක් 1978 දී ආරම්භ කරන ලදී. වසර දහයකට වරක් පැවැත්වෙන පාරිභෝගික අයවැය සමීක්‍ෂණය, සමාජ ආර්ථික දත්ත රාශියක් ඇතුළත් වන පරිදි නැවත සකස් කැරුන අතර එය වසර පහකට වරක් පැවැත්වීමට ද තීරණය කෙරිණි. රටේ සෑම තැනම පවත්නා මිළ ගණන් දැනගැනීම උදෙසා සෑම දිස්ත්‍රික්කයක්ම ඇතුළත් වන පරිදි මධ්‍යස්ථාන 100 කින් දත්ත රැස්කිරීමේ දීප ව්‍යාප්ත ක්‍රමයක් ආරම්භ කරන ලදී. පුළුල් කරන ලද සංඛ්‍යා රැස්කිරීමේ මෙම වැඩ සටහනට රජයේ නිදහස් ආනයන වැඩපිළිවෙලද ආර්ථිකයට අදළ විවිධ සංඛ්‍යා රාශියක් පිළිබඳ තොරතුරු රැස්කිරීමද ඇතුළත් විය.

### 1978 – 79 පාරිභෝගික අයවැය හා සමාජ ආර්ථික සමීක්ෂණය

පාරිභෝගික අයවැය සමීක්ෂණ මාලාවේ ප්‍රථම සමීක්ෂණය මහ බැංකුව විසින් 1953 දී පවත්වන ලදී. ඉන් පසුව 1963 දී හා 1973 දී ද මෙවැනිම සමීක්ෂණ පවත්වන ලදී. මෙම සමීක්ෂණවල ප්‍රධාන අරමුණ වූයේ කුටුම්භවල පාරිභෝගික රටාව, ඔවුන්ගේ ආදයම් ලැබෙන පිළිවෙල, ආදයම හා ආයෝජන අතර සම්බන්ධය සහ ණයගැති භාවය යන කරුණු පිළිබඳව තොරතුරු රැස්කිරීමය. සේවා නියුක්තිය හා අනෙකුත් සමාජ විචල්‍යතාවයන් පිළිබඳ අතිරේක තොරතුරු ද එක් රැස් කෙරිණි.

මෑත වර්ෂවල දී පාරිභෝගික රටා ආකෘතිය හා කුටුම්භයන්හි ආදයම් බෙදීයාම වේගයෙන් වෙනස්වීයාමේ හේතුවෙන් අවුරුදු පහකට වරක් පාරිභෝගික අයවැය සමීක්ෂණ පැවැත්වීමට මහ බැංකුව තීරණය කළේය. ඉහත දී පැවැත්වුනු සමීක්ෂණවලදී මෙන් තොරතුරු රැස් කිරීම සඳහා නියැදි සමීක්ෂණයක් පැවැත්වීමට 1978 මුලදී අදහස් කර තිබුණි. රජයේ සැලසුම් සඳහා සමාජ ආර්ථික විචල්‍යතාවයන් රාශියක් පිළිබඳව අංගසම්පූර්ණ තොරතුරු ලබාගැනීමේ හදිසි අවශ්‍යතාවය සපුරාලීම සඳහා සමීක්‍ෂණයෙහි ඇතුළත්වන කරුණු හා විෂය පථය පුළුල් කිරීමට පසුව තීරණය කරන ලදී. මේ අනුව " 1978-79 පාරිභෝගික අයවැය හා සමාජ ආර්ථික සමීක්ෂණය " යනුවෙන් නම් කැරුන නව නියැදි සමීක්ෂණයක් සකස් කරන ලදි. අදියර හතරකින් සමන්විත වන මෙම සමීක්ෂණයේ ප්‍රථම අදියරේ ක්‍ෂෙත්‍ර කටයුතු 1978 අවසන් කාර්තුව තුළදී නිමවන ලදී. මෙම අදියරේ කටයුතුවල ප්‍රතිඵල 1979 මැද භාගය වන විට දැනගත හැකි වේයැයි බලාපොරොත්තු වනු ලැබේ.

මෙකී සමීක්ෂණයට ග්‍රාමීය, නගරබද හා වතු යන අංශවලට ගැනෙන කුටුම්භ 8000 කින් යුත් නියැදියක් ඇතුළත්වේ. කලින් පැවැත්වුනු සමීක්ෂණවලදී මෙන් නොව මෙම සමීක්-ෂණය අදියර 4 කින් යුක්ත වන පරිදි වසරක් පුරා පැවැත්වීමටත්, එක් අදියරකට කුටුම්භ 2000 ක නියැදිය බැගින් ඇතුළත් කිරීමටත් අදහස් කරන ලදී. අදියර හතරකින් තොරතුරු රැස්කිරීම දෙයාකාරයකින් ප්‍රයෝජනවත් වෙයි. ප්‍රථමයෙන්ම ඉන් සමීක්ෂණයට භාජනය කෙරෙන සමාජ ආර්ථික විචල්‍යතාවයන්ගේ වාරික වෙනස්වීම් බලාගත හැකිවෙයි දෙවනුව, සමස්ථ ඇස්තමේන්තුවලට වාරික වෙනස්වීම් ඇතුළත් වෙයි

### ශ්‍රී ලංකාවේ පෞද්ගලික ආයෝජනය

මෙම සමීක්ෂණයට ඇතුළත් වන කරුණු හා විෂය පථය 1977 ආර්ථික විවරණයේ සවිස්තර වශයෙන් දක්වා ඇත. කුටුම්භ අංශයට අදළ ක්‍ෂෙත්‍ර කටයුතු 1977 දී අවසන් කෙරුන අතර ධීවර අංශයේ ක්‍ෂෙත්‍ර පරීක්ෂණයන් 1978 මාර්තු 27 හා 1978 ජූලි 10 යන කාලය තුළදී කරනු ලැබීය. තැපෑලෙන් යවනු ලැබූ ප්‍රශ්නාවලියට ව්‍යාපාරික අංශයේ ප්‍රතිචාරය නොදක්වීම ඉතා ඉහළ මට්ටමක පැවැතුණු හෙයින්, මෙම අංශය පිළිබඳව 1978 අගෝස්තු 16 හා 1978 සැප්තැම්බර් 3 වැනි දින අතර කාලය තුළ දී පෞද්ගලික සම්මුඛ පරීක්-ෂණයක් මගින් පසු විපරමක් කරන ලදි. දත්ත සැකසීමේ හා වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු 1979 අවසානය දක්වාම කෙරිගෙන යනු ලැබේ.

UNIVERSITY OF MORATUWA LIBRARY + SRI LANKA +

ආනයන ලිහිල් කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම

ආනයන ලිහිල් කිරීමේ වැඩ සටහන ක්‍රියාවට නැංවීම හා ඉදිරි කාලච්ඡේදයන් සඳහා ආනයන වියදම කල් ඇතිව ගණන් බැලීමේ අරමුණෙන් අරඹනු ලබන ණයවර ලිපි, ණයවර ලිපිවල සංශෝධනයන් හා ණයවර ලිපි වෙනුවෙන් ලැබෙන බිල්පත් පිළිබඳව වෙළෙඳ බැංකු-වලින් දත්ත රැස්කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම තොරතුරු පහත සඳහන් අයුරින් වර්ග කර ඇත.

(අ) ඉලක්කම් හතරකින් යුත් බ්‍ර.කි.නා. අංක අනුව වර්ගකර ඇති ණයවර ලිපිවල වටිනාකම,

(ආ) ආනයන වර්ගය අනුව වර්ගකර ඇති ණයවර ලිපිවල තවත් සවිස්තර බෙද දැක්වීමක්.

(ඇ) 1977 නොවැම්බර් 15 වැනි දින හා අංක 291/7 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි 1 වැනි උපලේඛනය සහ 2 වැනි උපලේඛනය පදනම් කොට ගෙන ණයවර ලිපිවල වටිනාකම වර්ගීකරණය කිරීම

(ඈ) බේරුම් කිරීමට ඉතිරිව ඇති ණයවර ලිපිවල වටිනාකම. මෙම සංඛ්‍යා සටහනෙහි නියත වශයෙන්ම ප්‍රයෝජනයට ගනුලැබූ ණයවර ලිපි පිළිබඳව විස්තර ද දක්වා ඇත.

දිවයින පුරා දත්ත රැස්කිරීමේ ක්‍රමය

1978 දී දිවයින පුරා දත්ත රැස්කිරීමේ ක්‍රමයක් දියත් කරන ලදි. දිවයින පුරා විසිර පවත්නා ස්ථාන සියයකින් පමණ පර්යේෂණාත්මක අවස්ථාව තුළදී පහත සඳහන් විස්තර වාරික වශයෙන් එකතු කරගෙන යනු ලැබේ.

(අ) පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල හා ඒවා ලබාගැනීමේ හැකියාව.

(ආ) කෘෂිකාර්මික නිෂ්පාදනවල නිෂ්පාදන මිල.

(ඇ) වී ගොවිතැන, තේ රබර් පොල් සුළුවතු සහ තැනීම් කර්මාන්ත පිළිබඳ වැටුප් පරිමාණයන් සහ කම්කරුවන් ලබාගැනීමේ හැකියාව.

(ඈ) කෘෂිකාර්මික නිෂ්පාදන පිරිවැය හා ඒවා ලබාගැනීමේ හැකියාව.

(ඉ) ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි පහසුකම්.

ආර්ථික විචල්‍යතාවයන්ගේ වැදගත් භාවය පදනම් කොට, දත්ත රැස්කිරීම, සතියකට, දෙසතියකට සහ මාසයකට වරක් බැගින් සිදු කරනු ලැබේ. මෙම ක්‍රමය යටතේ එක්රැස් කරන දත්ත පහත දැක්වෙන හේතූන් සඳහා භාවිතා කරනු ලැබේ.

(අ) පාරිභෝගික භාණ්ඩ හා කෘෂිකාර්මික යෙදවුම් ලබාගැනීමට ඇති හැකියාව සම්බන්ධ-යෙන් අදාළ අමාත්‍යාංශවලට වාරික වශයෙන් විස්තර සපයනු ලැබේ. එමගින් මෙම භාණ්ඩ බෙදහැරීම වැඩිදියුණු කිරීමට කෙටිකාලීන ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ හැකියාව වැඩිදියුණු වනු ඇත.

(ආ) පාරිභෝගික මිල සහ කෘෂිකාර්මික යෙදවුම් මිල පිළිබඳ දත්ත අනුසාරයෙන්, ප්‍රදේශ අතර ඇති වෙනස්කම් හා ඒවායේ වාරික අඩුවැඩිවීම් හඳුනාගනු ලැබේ. තවද මුළු දිවයිනටම බලපාන පරිදි සිල්ලර මිල දර්ශකයක් ද එක් එක් දිස්ත්‍රික්කයට හා ප්‍රදේශයට අදාළව වෙනම දර්ශක ද සැකසීමට විධිවිධාන යොදා ඇත.

(ඇ) භාණ්ඩවල සිල්ලර මිල හා ඒවායේ නිෂ්පාදන මිල අතර ඇති වෙනස මැන බැලීමට කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ නිෂ්පාදන මිල උපයෝගී කරගනු ලැබේ. මෙම විස්තර අනුව බෙදාහරින්නන් විසින් ලබා ගන්නා වෙළෙඳ ලාභයේ ප්‍රමාණය හඳුනාගැනීම ද, ඊට සුදුසු ප්‍රතිපත්තිමය තීරණයන් ගැනීම ද පහසුවෙයි. විවිධ නිෂ්පාදන ප්‍රදේශ අතර ඇති නිෂ්පාදන මිල සසඳ බලා, එම වෙනස්කම් ඇතිවීමට හේතු හඳුනාගෙන අවශ්‍ය අවස්ථාවලදී සුදුසු පිළියම් ද යොදනු ලැබේ.

(ඇ) ඉහත සඳහන් අංශයන්හි පවත්නා වැටුප් පරිමාණයන් පිළිබඳ දත්ත උපයෝගි කරගනු ලබන්නේ, ඒවායේ වාරික වශයෙන් ඇතිවන අඩුවැඩිවීම් හඳුනාගැනීම උදෙසා වැටුප් පරිමාන දර්ශක සැකසීමටත් ප්‍රදේශ හා විවිධ කාර්යයන් අනුව වැටුප් දර්ශකවල ඇති වෙනස්වීම් හඳුනාගැනීමටත් අවම වැටුප් අනපනත් හා වැටුප් මණ්ඩල ආඥාපනත් මඟින් පාලනය කරනු ලබන අනෙකුත් අංශයන්හි වැටුප් පරිමානයන් සමඟ සැසඳීමටත් ය. කම්කරු ශ්‍රමය ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳ විස්තර, කම්කරු ශ්‍රමය වැඩිපුර ඇති ප්‍රදේශවලින් එය ඌන ප්‍රදේශවලට සංක්‍රමනය වීම දිරිගැන්වීමට උපකාරයක් වනු ඇත. පුහුණු කම්කරුවන් අළුතින් බඳවාගැනීමට අවශ්‍යවන වෘත්තීන් කවරේදැයි හඳුනා ගැනීමට ද මෙම විස්තර උපකාරීවනු ලැබේ.

(ඉ) අලෙවි පහසුකම් ප්‍රමාණවත් නොමැති අවස්ථාවක් කවරේදැයි හඳුනා ගැනීමට අලෙවි පහසුකම් පිළිබඳ විස්තර උපකාරි වෙයි. තවද අදාළ අවස්ථාවන් සම්බන්ධයෙන් වෙළෙඳ පහසුකම් වැඩිදියුණු කිරීම අරභයා කෙටිකාලීන ප්‍රතිපත්තිමය තීරණයන් ගැනීම පිණිස ඒ ඒ අමාත්‍යාංශවලට මෙම විස්තර සැපයීම ද සිදු කරනු ලැබේ.

## කාර්‍ය මණ්ඩල පුවත්

1978 වර්ෂය තුළදී අධිපති පහත සඳහන් සමුළුවලට සහභාගි විය.

(අ) නේපාලයේ පැවති සීයැසන් අධිපතිවරුන්ගේ 13 වෙනි සම්මේලනය සහ ආසියානු නිෂ්කාශණ සංගමයේ අධිපතිවරුන්ගේ මණ්ඩලයේ 6 වෙනි සභා රැස්වීම. (ජනවාරි 14-25);

(ආ) ලංඩනයේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය මහබැංකු අධිපති වරුන්ගේ සාකච්ඡා සමුළුව සහ ස්විට්සර්ලන්තයේ බැසල්ස් හි ජාත්‍යන්තර ණය බේරුම් කිරීමේ බැංකුවේ වාර්ෂික මහා සභා රැස්වීම (මැයි 28—ජුනි 20);

(ඇ) කොරියානු ජනරජයේ සියෝල්හි පැවති ආසියානු එළදයිතා සංවිධානයේ පාලක මණ්ඩලයේ 20 වෙනි සභා වාරය. (ජුලි 1 — 13);

(ඈ) වොෂිංටනයේ පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ජා ප්‍ර.ස. බැංකුවේ වාර්ෂික සභා රැස්වීම, ටෙහෙරානයේ බැන්ක් මෙල්ලි ඉරාන් හි 50 වෙනි සාංවත්සරිකෝත්-සවය හා එංගලන්ත බැංකුව සහ ලංඩන් හි වාණිජ බැංකු සමග පැවති නිල සාකච්ඡා (සැප්තැම්බර් 9—ඔක්තෝබර් 12);

(ඉ) හොංකොංහි පැවති ආයෝජන සංවර්ධන සම්මන්ත්‍රණය හා සිංගප්පූරුවේ පැවති නිල සාකච්ඡා (දෙසැම්බර් 3 — 12);

මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ලාල් ජයවර්ධන බෙල්ජියමේ යුරෝපීය ආර්ථික හවුලේ ශ්‍රී ලංකා තානාපති වශයෙන් පත් කිරීමත් සමඟ, 1978 මාර්තු 8 වෙනි දින සිට මුදල් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ඔහුගේ නිල හෙබවීම අවසන් විය.

ජනවාරි 14 වෙනි දින සිට 25 වෙනි දින දක්වා අධිපතිතුමා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මුදල් නීති පනතේ 24 වෙනි වගන්තිය යටතේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු

කළේය. ආචාර්ය තිලකරත්න මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් තනතුර භාර ගැනීම සඳහා 1978 මාර්තු 28 වැනි දින සිට බැංකු සේවයෙන් විශ්‍රාම ගිය අතර, එකී දින සිට ඔහු මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයා බවට පත් විය.

ආචාර්ය තිලකරත්න නොසිටි කාල සීමාවේදී, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් සී. චන්මුගම් මහතා මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයා වශයෙන් කටයුතු කළේය.

නියෝජ්‍ය අධිපති ආචාර්ය ගාමණී කොරයා, එක්සත් ජාතීන්ගේ වෙළඳ සහ සංවර්ධන සමුළුවේ මහ ලේකම්වරයා වශයෙන් තව දුරටත් සේවයෙහි නිරතවිය.

නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වෛකල්පික විධායක අධ්‍යක්ෂ වශයෙන් තවදුරටත් සේවයෙහි නිරතවිය.

1978 අප්‍රේල් 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, නියෝජ්‍ය අධිපති ලෙස පත් කරන ලද අධිපතිගේ සහකාර ඊ. එරමුදුගොල්ල මහතා 1978 අප්‍රේල් 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ලෙස නිළ නම් කරන ලදී. අධිපතිතුමා නොසිටි අවස්ථාවන්හි දී ඊ. එරමුදුගොල්ල මහතා, මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය යටතේ, බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය,

සේවක අර්ථ සාධක අරමුදලේ අධිකාරි ආචාර්ය එච්. එන්. එස් කරුණාතිලක 1978 ජනවාරි 2 වැනි දින සිට උපදේශක ලෙස පත් කරන ලද අතර, 1978 අප්‍රේල් 10 වැනි දින සිට නියෝජ්‍ය අධිපති ලෙස පත් කරන ලදී. 1978 ජුනි 23 වැනි දින සිට ආචාර්ය කරුණාතිලක බැංකු කරුවන් පුහුණු කිරීමේ ආයතනයේ පාලන මණ්ඩලයේ සභාපති ලෙස නම් කරන ලදී.

අධිපති ගේ සහකාර සහ මුදල් මණ්ඩලයේ ලේකම් කේ. කනගසභාපති මහතා 1978 අප්‍රේල් 20 වැනි දින සිට අධිපතිගේ ජ්‍යෙෂ්ඨ සහකාර ලෙස පත් කරන ලද අතර මුදල් මණ්ඩලයේ ලේකම් වශයෙන් තව දුරටත් ක්‍රියා කළේය.

උපදේශක ජේ. ජී. පී. ජයසුන්දර මහතා 1978 අප්‍රේල් 10 වැනි දින සිට අධිපතිගේ සහකාර ලෙස පත් කරන ලදී.

ප්‍රධාන ගණකාධිකාරි ඒ. බණ්ඩාරනායක මහතා, 1978 නොවැම්බර් 11 වැනි දින සිට විශ්‍රාම පූර්ව නිවාඩු ලබාගත්තේය.

කළමනාකාරීත්ව විගණන අධ්‍යක්ෂක ටී. චච්චිත්තානන්දන් මහතා, 1978 මාර්තු 27 වැනි දින සිට මහ කොළඹ ආර්ථික කොමිසමට මුදා හරින ලද අතර, 1978 මැයි 1 වැනි දින සිට බැංකු සේවයට ආපසු පැමිණියේය. 1978 නොවැම්බර් මස 24 වැනි දින සිට චච්චිත්තානන්දන් මහතා දෙපාර්තමේන්තු ප්‍රධාන මට්ටමේ උපදේශක ලෙස නිළ නම් කරන ලදී.

ගැම්බියා මහ බැංකුව වෙත මුදා හරින ලද ඩී. එල්. කන්නන්ගර මහතා 1978 පෙබරවාරි 1 වැනි දින සිට බැංකු සේවයට ආපසු පැමිණි අතර ආපසු වැඩ භාර ගැනීමෙන් පසු බැංකු සංවර්ධන උපදේශක වශයෙන් පත් කරන ලදී.

රාජ්‍ය ණය අධිකාරි එන්. කදිරගාමතම්බි මහතා 1978 ජනවාරි 2 වැනි දින සිට ව්‍යවහාර මුදල් අධිකාරි ලෙස පත් කරන ලදී.

ආයතන අධ්‍යක්ෂ ආචාර්ය ඒ. ජී. ඒ. ඩී. පෙරේරා, 1978 ජනවාරි 2 වැනි දින සිට ලේකම් ලෙස පත් කරන ලදී.

බැංකු පරිපාලන අධ්‍යක්ෂ වී. එස්. සුබ්‍රමානියම් මහතා, 1978 නොවැම්බර් 10 වැනි දින සිට ප්‍රධාන ගණකාධිකාරි ලෙස පත් කරන ලදී.

අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක 1978 ජනවාරි 2 වැනි දින සිට සංඛ්‍යාන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

ඒ. එස්. ජයවර්ධන මහතා, 1978 ජනවාරි 2 වැනි දින සිට ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

අතිරේක විනිමය පාලක ඒ. ආර්. ප්‍රනාන්දු මහතා 1977 දෙසැම්බර් 3 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 1978 අප්‍රේල් 28 වැනි දින වැඩබලන විනිමය පාලක ලෙස පත් කරන ලදී.

වැඩබලන ලේකම් එස්. ඩබ්ලිව්. පී. අමරසූරිය මහතා 1978 ජනවාරි 2 වැනි දින සිට සේවක අර්ථ සාධක අරමුදලේ වැඩබලන අධිකාරී ලෙස පත් කරන ලදී.

නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී එච්. ප්‍රේමරත්න මහතා, 1978 ජනවාරි 2 වැනි දින සිට වැඩබලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ලෙස පත් කරන ලදී. ප්‍රේමරත්න මහතා ගැම්බියාවේ මහ බැංකුවේ මූල්‍ය පරිපාලක වශයෙන් සේවය පිණිස 1978 සැප්තැම්බර් 12 වැනි දින සිට අවුරුද්දක කාලසීමාවක් සඳහා මුදා හරින ලදී.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධිකාරී ආචාර්ය එස්. ටී. ජී. ප්‍රනාන්දු 1978 ජනවාරි 2 වැනි දින සිට වැඩ බලන රාජ්‍ය ණය අධිකාරී ලෙස පත් කරන ලදී.

නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂ ආර්. එම්. තෙන්නකෝන් මහතා 1978 ජනවාරි 2 වැනි දින සිට වැඩබලන ආයතන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්. ඩී. කේ. ජේ. අර්ථනායක මහතා, 1978 මාර්තු 27 වැනි දින සිට වැඩබලන කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී යූ. ඒ. ද සිල්වා මහතා 1978 නොවැම්බර් 10 වැනි දින සිට වැඩබලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ලෙස පත් කරන ලදී.

එස්. ඊස්පරදසන් මහතා සහ ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු අර්ධකාලීන වශයෙන් මහා භාණ්ඩාගාරය වෙත තව දුරටත් මුදා හරින ලදහ.

ක්‍රමසම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට මුදා හරින ලද ආචාර්ය පී. ඒ. එස්. දහනායක, 1978 මාර්තු 19 වැනි දින සිට බැංකු සේවයට ආපසු පැමිණියේය.

සංවර්ධන මුදල් සංස්ථාවට මුදා හරින ලද ජී. එම්. පී. ඩී. ද සිල්වා මහතා 1978 පෙබරවාරි 8 වැනි දින සිට බැංකු සේවයට ආපසු පැමිණියේය.

1978 ජනවාරි 3 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පී. එම්. නාගහවත්ත මහතා, සිමෙන්ති සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ලෙස කර්මාන්ත සහ විද්‍යා කටයුතු අමාත්‍යාංශයට මුදා හරින ලදී. නාගහවත්ත මහතා 1978 සැප්තැම්බර් 1 වැනි දින සිට බැංකු සේවයට ආපසු පැමිණියේය.

මහා භාණ්ඩාගාරය වෙත මුදා හරින ලද ආචාර්ය ටී. ඩබ්ලිව්. වයි. රණවීර, එක්සත් ජාතීන්ගේ තනතුරක් භාර ගැනීම සඳහා 1978 අප්‍රේල් 16 වැනි දින සිට තව දුරටත් මුදාහරින ලදී.

ධීවර අමාත්‍යාංශයට මුදා හරින ලද ඊ. එම් ඩී. පීරිස් මහතා, 1978 පෙබරවාරි 2 වැනි දින සිට ආපසු බැංකු සේවයට පැමිණියේය.

ඩබ්ලිව්. එල්. ද සිල්වා මහතා 1978 ජුනි 21 වැනි දින සිට "මාර්ක්පෙඩ්"හි සාමාන්‍යාධිකාරී ලෙස ආහාර සහ සමුපකාර අමාත්‍යාංශය වෙත මුදා හරින ලදී.

විමසුමට ලක් වූ වර්ෂය තුළ දී මහ බැංකුවේ පහත නම් සඳහන් නිලධාරීහු පූර්ණ කාලීන වශයෙන් තව දුරටත් රජය වෙත මුදා හරින ලදහ.

| | | |
|---|---|---|
| ටී. ජී. පුංචිඅප්පුහාමි මහතා | — | රාජ්‍ය මැණික් සංස්ථාව |
| එස්. රාජලිංගම් මහතා | — | මහා භාණ්ඩාගාරය |
| පී. එම්. හසන් මහතා | — | ආහාර හා සමුපකාර අමාත්‍යාංශය |
| ඒ. ඒ. ඩී. ජස්ටින් මහතා | — | කර්මාන්ත අමාත්‍යාංශය |
| එම්. බී. දිසානායක මහතා | — | මහා භාණ්ඩාගාරය |